# 8 ආදිපිතෘ ජාකොබ් තුමා



8.1 රූපය - ජාකොබ් තුමාගේ උපත

## ආදිපිතෘ ජාකොබ් තුමාගේ උපත

ආබ්‍රහම්ට දාව ඊසාක් ඉපදිණි. මොහු බෙතුයෙල්ගේ දූව හා ලාබන්ගේ සොහොයුරිය ද වන රෙබෙකා සිය බිරිඳ මෙන් සරණපාවාගන්න කල්හි ඔහුගේ වයස අවුරුදු සතළිසකි. ඇ වඳ ස්ත්‍රියක වූයෙන්, ඔහු තම බිරිඳ උදෙසා බැගෑපත් ලෙස සමිඳාණන් වහන්සේ අයැදී ය. උන් වහන්සේ ඔහුගේ ඉල්ලීමට සවන් දුන් සේක. රෙබෙකා ගැබ්ගත්තා ය. ඇගේ කුසයෙහි හුන් දරුවන් දඟලන්නට ගත් විට, "තත්ත්වය මෙහෙම නම් මා ඉඳලා කුමකට ද"යි කියමින්, ඕ සමිඳාණන් වහන්සේගෙන් විමසීමට ගියා ය. සමිඳාණන් වහන්සේ ඇට කතා කොට මෙසේ වදාළ සේක: "ජාතීන් දෙකක් ඔබ කුස තුළ ඇත; දෙවර්ගයක සෙනඟක් ඔබ කුසෙන් බෙදී නික්මෙති. එක සෙනඟක් අනිකට වඩා බලවත් වෙති; වැඩිමලා බාලයාට මෙහෙ කරනු ඇත." ඇගේ ප්‍රසූත කාලය සම්පූර්ණ වූ විට, මෙන්න, ඇගේ කුසෙහි නිවුන් දරුවෝ සිටියහ. පළමුවැන්නා උපන්නේ ය. ඔහු රතු පාට ය, ඔහුගේ ඇඟ පුරා ම ලෝම වැස්මක් මෙන් විය. එබැවින් ඔහුට ඒසව් යන නම

දෙන ලදී. ඉන්පසු උපන්නේ ඔහුගේ සහෝදරයා ය. ඔහු තම අතින් ඒසව්ගේ විලුඹ අල්ලාගෙන සිටියේ ය. එබැවින් ඔහුට ජාකොබ් යන නම දෙන ලදි. රෙබෙකාට මොවුන් ලැබෙන විට ඊසාක්ගේ වයස අවුරුදු හැටකි.

(උත්පත්ති 25:19-26)



8.2 රූපය - බෙතෙල්හි දර්ශනය

## බෙතෙල්හි දර්ශනය (ගිවිසුම අලුත් කිරීම)

ජාකොබ් බෙයර්-ෂෙබායෙන් නික්ම හාරාන් බලා ගියේ ය. ඔහු එක්තරා ස්ථානයකට පැමිණ, ඉර බැස ගිය හෙයින්, මුළු රාත්‍රිය ම එහි ගත කෙළේ ය. තව ද ඔහු එතැනින් ගලක් රැගෙන, එය මත හිස තබාගෙන නිදන්නට විය. එවිට ඔහු සිහිනයක් දිටී ය. පුදුමයකි! පොළොවෙහි තබන ලද ඉණිමඟකි. එහි මුදුන අහස දක්වා විය. මෙන්න, දෙවියන් වහන්සේගේ දූතයෝ එහි නඟිමින් ද බසිමින් ද සිටියෝ ය. සමිඳාණන් වහන්සේ එයට ඉහළින් සිට, "මම වනාහි නුඹේ පියා වූ ආබ්‍රහම්ගේ දෙවියන් වහන්සේ ද ඊසාක්ගේ දෙවියන් වහන්සේ ද වන සමිඳාණන් වහන්සේ වෙමි. නුඹ සැතපී සිටින දේශය මම නුඹටත්, නුඹේ පෙළපතටත් දෙන්නෙමි. තවද, නුඹේ පෙළපත පොළොවේ දූවිලි මෙන් වැඩි වී, උතුරු, දකුණු, බටහිර, නැගෙනහිර දිශාවල පැතිර

යන්නේ ය. මිහි පිට සියලු ජාතීහු නුඹ හා නුඹේ පෙළපත මඟින් තමන් ආශීර්වාද කරගන්නෝ ය. මෙන්න, මම ද නුඹ සමග සිටිමි. නුඹ යන සියලු තැන්හි මම නුඹ රැක බලාගෙන මෙම දේශයට ම නුඹ නැවත ගෙනෙන්නෙමි. මන්ද, මා නුඹට කී දේ ඉටු කරන තුරු මම නුඹ අත නොහරින්නෙමි"යි වදාළ සේක. ජාකොබ් නින්දෙන් අවදි ව, "සැබැවින් ම සමිඳාණන් වහන්සේ මෙම ස්ථානයෙහි වැඩ සිටින සේක. එහෙත් මම එය නොදැන සිටියෙමි"යි කී ය. ජාකොබ් අලුයම නැඟිට, තම හිසට තැබූ ගල ගෙන, සිහිවටනයක් කොට එය සිටුවා, එහි මුදුනේ තෙල් වත් කළේ ය. තවද, ඔහු ඒ ස්ථානයට "දෙවියන් වහන්සේගේ ගෘහය" යන අර්ථය ඇති "බෙතෙල්" යයි නම් කෙළේ ය.

(උත්පත්ති 28:10-16, 18-19)

දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කර ගත් ගිවිසුම ජාකොබ් තුමා සමග නැවත අලුත් කළ සේක. "නුඹ සැතපී සිටින දේශය නුඹටත් නුඹේ පෙළපතටත් දෙන්නෙමි. නුඹේ පෙළපත පොළොවේ දූවිලි මෙන් වැඩි වී උතුරු, දකුණු, බටහිර, නැගෙනහිර දිශාවල පැතිර යන්නේ ය." ජාකොබ් තුමාට මෙහි දී දේව කැඳවීමක් ලැබුණේ ය. නින්දෙන් පිබිදුන ජාකොබ් තුමා එම ස්ථානයට "දෙවියන් වහන්සේගේ ගෘහය" යන අර්ථය ඇති බෙතෙල් යන නම තැබී ය.

## පෙනුයෙල්හි දර්ශනය (උත්පත්ති 32:24-32)



8.3 රූපය - පෙනුයෙල්හි දර්ශනය

ජාකොබ් තුමා හාරාන්හි ජීවත් වී ආපසු පොරොන්දු දේශයට පැමිණෙමින් සිටියේ ය. එක්තරා මිනිසෙක් එක් රාත්‍රියක පහන් වන තුරු ම ඔහු සමග පොර බැදුවේ ය. ඒ තැනැත්තාට එතුමාගෙන් ජය නොලැබෙන බව දුටු විට, ඔහු එතුමාගේ කලවා සන්ධියට පහරක් ගැසී ය. එවිට ජාකොබ් තුමාගේ කලවා සන්ධිය විසන්ධි විය. පහන් වේගෙන එන බැවින් ඔහුට යන්නට ඉඩ හරින්න යැයි ඒ තැනැත්තා ජාකොබ් තුමාට කී විට, "ඔබ මට ආශිර්වාද

කළොත් මිස මම ඔබට යන්න නොහරින්නෙමි"යි කීවේ ය. එවිට ඒ තැනැත්තා "ඔබේ නම කුමක් ද"යි ඇසූ විට, "මා ජාකොබ් යැ"යි එතුමා කීවේ ය. එවිට "මින් මතු ඔබේ නම ජාකොබ් නොවනු ඇත. ඔබ දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා සමඟ පොර බදා ජයගත් බැවින් ඔබේ නම 'ඉශ්‍රායෙල්' වන්නේ ය"යි ඒ තැනැත්තා කීවේ ය. "කරුණාකර මට ඔබේ නම කියන්නැ"යි ජාකොබ් තුමා ඉල්ලී ය. "ඔබ, මගේ නම අසන්නේ මන්ද"යි කියා ඔහු ජාකොබ් තුමාට ආශිර්වාද කළේ ය. මෙම කතාවෙන් කියවෙන්නේ ජාකොබ් තුමා තුළ ඇති වූ ආධ්‍යාත්මික පොර බැදීමක් ගැන බව ද පැහැදිලි ය.

### ජාකොබ් ඒසව් හා සමගි වීම



8.4 රූපය - ජාකොබ් ඒසව්ට වැදීම



8.5 රූපය - ඒසව් සමග සමගිවීම

> ජාකොබ් නෙත් ඔසවා බැලූ විට, පුදුමයකි, ඒසව් ද ඔහු සමඟ හාරසියයක පිරිසක් ද එනු දිටී ය. ජාකොබ් තම සොහොයුරා වෙත පැමිණෙන තෙක් සත් වරක් බිමට නැමී වැන්දේ ය.
>
> (උත්පත්ති 33:1-3)

ඉහත බයිබලීය පාඨයෙන් අපට පෙන්නුම් කරන්නේ ජාකොබ් තම සොහොයුරු ඒසව් සමග සමගි වීම යි. සහෝදර ඒසව් තමා වෙත පැමිණෙන දුටු විට ජාකොබ් තුමා ඔහු ඉදිරියේ සත් වරක් වැඳ වැටීමෙන් මෙය පෙන්නුම් කරයි. ජාකොබ් තුමාගේ ක්‍රියාවට ප්‍රතිචාර ලෙස ඒසව් ජාකොබ් තුමා වැළඳ ගෙන

හැඬූ බව ශුද්ධ බයිබලයේ වාර්තා වේ. ඔවුන් වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන් ද සමගි විය. අන් අයට සමාව දෙන අයට දෙවියන් වහන්සේ ද සමාව දෙන සේක.

### ඒසව් සමග ජාකොබ් සමගි වීමෙන් ලබා ගතහැකි ආදර්ශ

- ★ වරදක් කළ කල්හි එම වරද පිළිගෙන සමාව ලබා ගත යුතු ය.
- ★ තමාට වැරදි කළ අයට සමාව දිය යුතු ය.
- ★ වචනයෙන් සමාව දී ක්‍රියාවෙන් ද එය ඔප්පු කළ යුතු ය.
- ★ සහෝදරයා සමග සමගියෙන් ජීවත් විය යුතු ය.

### ක්‍රියාකාරකම

1. ජාකොබ් තුමාගේ දෙමව්පියන් නම් කරන්න.
2. රෙබෙකාට ලැබුණු නිවුන් දරුවන් දෙදෙනාගේ නම් ලියන්න.
3. රෙබෙකාගේ කුසෙහි සිටි දරුවන් ගැන දෙවියන් වහන්සේ පැවසුවේ කුමක් ද?
4. ඒසව් සහ ජාකොබ් යන නම්වල අර්ථ ලියන්න.
5. බෙතෙල්හි දර්ශනය කෙටියෙන් ලියන්න.
6. "බෙතෙල්" යන්නෙහි අර්ථය ලියන්න.
7. ජාකොබ් තුමාට "ජාකොබ්" යන නම ලැබීමට හේතුව ලියන්න.
8. ජාකොබ් තුමා ඒසව් සමග සමගිවීමේ සිද්ධිය තුළින් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.



### ජීවිතයට බිඳක්

- ★ *සැම දෙනා සමග සමගියෙන් ජීවත් වෙමු.*
- ★ *අප හා විරසක වූ අය සමග මිතුරු වෙමු.*
- ★ *දේව හඬට ප්‍රතිචාර දක්වමු.*